ලංකාපුර ප්‍රාදේශීය සභාව - 2024
----

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ලංකාපුර ප්‍රාදේශීය සභාවේ 2024 දෙසැම්බර් 31 දිනට වත්කම් හා වගකීම් ප්‍රකාශනය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම්/ ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාළ තොරතුරු ද ඇතුළත් මූල්‍ය ප්‍රකාශන වලට අදාළ සටහන් වලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උපවගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10(1) උපවගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට ලංකාපුර ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.
ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දූස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

(අ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

1.6.1 පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම

	අදාල ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ අංක 02 හි ඊ.ජී 4.6 ප්‍රකාරව සේවක ණය සහ අත්තිකාරම් ඇතුළු සියළුම වර්ගවල ලැබිය යුතු දෑ සඳහා ප්‍රතිපාදනයන් ඇති කළ යුතු වුවත්, එසේ සිදුකර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ආ)	පලාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතියේ අංක 6.20 ප්‍රකාරව වාර්තා කරනු ලබන කාලපරිච්ඡේදයේ අවසාන දිනට එක් එක් වත්කම් වලට අදාලව පිරිවැය, සමුච්චිත ක්ෂය,වාර්ෂික ක්ෂය සහ ශුද්ධ අගය දක්වමින් උපලේඛන සකස් කර ඉදිරිපත් කළ යුතු වුවත්, වත්කම්වල ශුද්ධ අගය පමණක් දක්වා උපලේඛන සකස් කර ඉදිරිපත් කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	පළාත් පාලන ආයතන සඳහා වූ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

1.6.2 ගිණුම්කරණ අඩුපාඩු

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ඉකුත් වර්ෂයේදී මිළදීගෙන තිබුණු සවිකිරීම් 03කට අදාලව රු.810,300 ක වාර්ෂික ක්ෂය ගණනය කර නොතිබීම හේතුවෙන් වාර්ෂික සවිකිරීම් ක්ෂය එම ප්‍රමාණයෙන්ම අඩුවෙන් දක්වා තිබුණි.	2023 වර්ෂයේ මිලදී ගෙන ඇතත්, 2024 වර්ෂයේදී භාවිතයට ගෙන ඇති නිසා අදාළ වර්ෂයේදී ක්ෂය සිදු කර නොමැති බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ආ)	අයිතම 15 කට අදාල වටිනාකම රු.786,474 ක තොග ශේෂයක් සහ අයිතම 18 කට අදාල භාණ්ඩ ඒකක 464 ක වටිනාකම තක්සේරු කර ගිණුම්ගත කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

(ඇ)	දේපල පිරියත උපකරණ යටතේ දැක්විය යුතු වටිනාකම රු. 620,220 ක් වූ අයිතම 05ක් ගබඩා තොග ශේෂ යටතේ දක්වා තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඈ)	කර්මාන්ත ණය හිමි ශේෂය රු.34,808,790 ක් අඩුවෙන් හා කර්මාන්ත ණය ගැති ශේෂය රු.31,478,306 ක් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඉ)	විවිධ තැම්පත් ගිණුම රු.148,520 ක් අඩුවෙන් සටහන් කර තිබුණි.	පොදු ජ'නලයේ අගය වැරදි ලෙස සටහන් වී ඇති බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඊ)	ලැබිය යුතු රු.101,375 ක සෝලා සූර්ය විදුලි පද්ධතියේ හිඟ ආදායම මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(උ)	මල අපවහන පද්ධතියට ගලි මුදා හැරීමේ ගාස්තු ආදායම රු.625,050 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබූ අතර රු.125,500 ක හිඟ ආදායම සටහන් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඌ)	ස්ථාවර නියෝග මත සිදු කරන ගනුදෙනු ගෙවීම් ගිණුම් වලට ගැලපීම් නොකිරීම හේතුවෙන් රු.452,595 ක වියදම් අඩුවෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය
(එ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනවන විට ගෙවා අවසන් කර ඇති කර්මාන්ත ණය ගැතියන් 07 කට අදාල වටිනාකම රු.2,420,829 ක් කර්මාන්ත ණයගැති ගිණුමෙන් ඉවත්කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඒ)	ඉතුරුම් පොලී ආදායම රු.179,868 ක් වැඩියෙන් ගිණුම්ගත කර තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඔ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට ගෙවියයුතු රු.589,101 ක වටිනාකමක් ණයහිමි ශේෂයෙන් හා වියදම් ගිණුම් වලින් මගහැරී තිබුණි.	ඉදිරියේදී නිවැරදි කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ඕ)	ප්‍රාග්ධන ප්‍රධාන යටතේ නොදැක්විය යුතු ප්‍රාග්ධන ස්වරූපයෙන් නොගන්නා හා සභාවට අයිතියක් නොමැති වත්කම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී හා ඉකුත් වර්ෂවලදී ලද ආධාර ප්‍රාග්ධන ප්‍රධාන යටතේ සටහන් කිරීම හේතුවෙන්, එහි අගය රු.4,037,273 කින් වැඩියෙන් දක්වා තිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය

(ක)	සමාලෝචිත වර්ෂයේ දී ඉදිකළ ගොඩනැගිලි 10 කට අදාල රු.38,682,998 ක් හා පාලම් බෝක්කු මංමාවත් හා වෙනත් ඉදිකිරීම් 09 ක රු.24,141,828 ක් ඇතුළුව රු.62,824,826 ක් වටිනා ඉදිකිරීම් ශේෂ 19 ක් දේපල පිරියත උපකරණ තුල දක්වා නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ග)	මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුල මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදි වෙනත් ජංගම වගකීම් අඩුවීම් ලෙස රු.5,372,723 ක් දෝෂ සහගතව දක්වා තිබුණි.	පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය
(ච)	ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහ ගණනය කිරීමේදී රු.15,000,000 ක ස්ථාවර තැම්පතු මුදල්කර ගැනීම සටහන්කර නොතිබුණි.	පරීක්ෂා කර බලා නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය
(ජ)	සමාලෝචිත වර්ෂයේදී මිළදී ගත් රු.211,500 ක් වූ යන්ත්‍ර 02 ක වටිනාකම යන්ත්‍ර ගිණුමේ දක්වා නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.
(ට)	සූර්ය විදුලි උත්පාදක පද්ධතියෙන් නිෂ්පාදිත විදුලිය හා විදුලිබල මණ්ඩලයෙන් ලබා ගන්නා විදුලිය අතර වෙනස ගිණුම්වලට ගැලපීම හේතුවෙන් සූර්ය පැනල ආදායම රු. 725,718 ක් හා විදුලි වියදම රු.200,803 ක් ගිණුමේ දක්වා නොතිබුණි.	නිවැරදි කිරීමට කටයුතු කරන බව.	නිවැරදිව ගිණුම් ගත කළ යුතුය.

1.6.3 නොසැසඳු පාලන ගිණුම්

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට පිළියෙල කර තිබුණු මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන ගිණුම් ශේෂ 07 ක වටිනාකම එම ගිණුම් ශේෂ වලට අදාල උපයෝගී ලේඛන වල ශේෂ සමඟ සැසදීමේදී, රු.4,953,004 ක නොසැසදීමක් පැවතුණි.	පරීක්ෂා කර බලා නිවැරදි කරන බව.	ගිණුම් පොත්පත් සැසඳීම් කර නිවැරදි අගයන් සටහන් කළ යුතුය.
(ආ)	මූල්‍ය ප්‍රකාශවල දැක්වෙන ගිණුම් ශේෂ 52 ක වටිනාකම පොදු ලෙජරයේ එම ගිණුම් වල ශේෂ සමග රු. 14,882,054 ක නොසැසදීමක් විය.	පරීක්ෂා කර බලා නිවැරදි කරන බව.	ගිණුම් පොත්පත් සැසඳීම් කර නිවැරදි අගයන් සටහන් කළ යුතුය.

1.6.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන එකතුව රු. 4,255,871 ක වත්කම් ශේෂක්, වගකීම් ශේෂ 6 ක් හා ආදායම් ශේෂ 20 ක් අදාල ලේඛණ, උපලේඛණ හා ශේෂ සනාථ ලිපි ඉදිරිපත් නොකිරීම හේතුවෙන් සතුටුදායක ලෙස සත්‍යාක්ෂණය හා සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.	ඉදිරියේදි නියමිත සාක්ෂි ඉදිරිපත් කරන බව.	නියමිත සාක්ෂි ඉදිරිපත් කළ යුතුය.

1.7 අනුකූල නොවීම්

1.7.1 නීති,රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

නීති,රීති,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවූ අවස්ථා පහත දැක්වේ.

	නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව	අනුකූල නොවීම	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	පනත්			
	1988 අංක 56 හා 2000 අංක 53 දරන පනත් වලින් සංශෝධනය වූ 1980 අංක 47 දරන ජාතික පරිසර පනත 23 (අ) ඡේදය	ප්‍රාදේශීය සභාව විසින් නඩත්තු කර පවත්වාගෙන යනු ලබන සුංගාවිල කසල කළමණාකරන මධ්‍යස්ථානය හා මළ අපවහන පද්ධතිය සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගෙන නොතිබුණි.	පරිසර බලපත්‍ර ඉල්ලුම් කර ඇති බව.	පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබාගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහයේ XXIV වැනි පරිච්ඡේදයේ 14. 01 (ඊ) හා (උ)	විශ්‍රාම වැටුප පරිවර්ථනය කිරීම සඳහා දෙනු ලබන අවලංගු කල නොහැකි පොරොන්දු ප්‍රකාශ ලබා ගැනීමකින් තොරව රු.3,250,000 ක් නිළධාරීන් 13 දෙනෙකු වෙත ආපදා ණය ලබා දී තිබුණි.	පිළිගන්නා බව.	ආයතන සංග්‍රහය ප්‍රකාරව කටයුතු කළ යුතුය.
(ඇ)	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ			
(i)	1992 අගෝස්තු 19 දිනැති අංක 26/92 දරන හා රාජ්‍ය පරිපාලනය චක්‍රලේඛය	සභාවේ වාහන 06ක රාජ්‍ය ලාංඡනය යොදා නොතිබුණි.	වාහන වල බඳෙහි රාජ්‍ය ලාංඡන යෙදීමට කටයුතු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

(ii)	2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන හා කළමණාකරන අමාත්‍යාංශ ලේකම්ගේ චක්‍රලේකයේ 3.1 වගන්තිය	වාහන 06 ක් සම්බන්ධයෙන් ඉන්ධන දහන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි.	පරීක්ෂාවන්සිදුකිරීමට කටයුතු කරන බව.	චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කළ යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ අයහාරය ඉක්ම වූ වියදම රු.2,259,421 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අයහාරය ඉක්ම වූ වියදම රු.11,789,264 ක් විය.

2.2 ආදායම් පරිපාලනය

2.2.1 ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම්

ලේකම්වරිය විසින් ඉදිරිපත් කළ තොරතුරු අනුව සමාලෝචිත වර්ෂයට හා ඉකුත් වර්ෂයට අදාලව ඇස්තමේන්තුගත ආදායම්, බිල් කළ ආදායම්, රැස් කළ ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

		2024				2023		
ආදායම් ප්‍රභවය	ඇස්තමේන්තු ගත ආදායම	2024 බිල් කල ආදායම	රැස්කල ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය	ඇස්තමේන්තු ගත ආදායම	බිල් කල ආදායම	රැස්කල ආදායම	දෙසැම්බර් 31 දිනට මුළු හිඟය
	රු	රු	රු	රු	රු	රු	රු	රු
වරිපනම් බදු	2,551,200	852,640	932,790	80,150	858,400	607,190	807,650	408,850
කුලී	27,957,100	23,851,886	23,883,899	2,012,857	20,554,415	18,281,261	18,918,649	1,980,844
බලපත්‍ර ගාස්තු	694,540	599,466	627,416	27,950	1,147,560	348,787	458,487	220,600
වෙනත් ආදායම්	73,771,590	49,461,616	48,800,610	661,006	4,412,260	4,409,483	4,258,622	643,629
	-------------	-----------------	--------------	----------------	--------------	--------------	---------------	--------------
එකතුව	104,974,430	74,765,608	74,244,715	2,781,963	26,972,635	23,646,721	24,443,408	3,253,923
	========	==========	=======	========	========	========	========	=======

- ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් විගණනයට ඉදිරිපත් කල ඉහත තොරතුරු වල ගණිතමය නොසැසඳීම් විය.

2.2.2 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

සභාවේ ආදායම් රැස්කිරීමේ කාර්ය සාධනය සම්බන්ධ නිරීක්ෂණ පහත දැක්වේ.

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	**කුලී** එළ හරක් මස් කඩ කුලියට දීම වෙනුවෙන් 2006 සිට 2011 දක්වා බදු ගැනුම්කරුවන් 09 දෙනෙකුගෙන් අයවිය යුතු රු.1,348,221 ක් අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි.	2025 වර්ෂයේදි අය කර ගැනීමට කටයුතු කරන බව.	හිඟ ආදායම් අයකර ගැනීමට කටයුතු කළ යුතුය.
(ආ)	**උසාවි දඩ හා මුද්දර ගාස්තු** පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සහ අනෙකුත් බලධාරීන්ගෙන් 2024 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු ලෙස දක්වා තිබුණු උසාවි දඩ රු. 23,557,700 ක් හා මුද්දර ගාස්තු රු.9,500,106 ක් විය.	පිළිගන්නා බව.	නියමිත ආදායම් ගෙන්වා ගැනීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 පනතින් පවරා ඇති කායර්න් ඉටුකිරීම

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගිතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරිම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ප්‍රාදේශීය සභා පනතේ 126 වගන්තිය යටතේ ප්‍රධාන කරුණු 23 ක් ඉටු කිරීම සඳහා අතුරු ව්‍යාවස්ථා පැනවිය හැකි වුවද 2024 දෙසැම්බර් 31 දින වන විට ප්‍රධාන කරුණු 10 ක් වෙනුවෙන් අතුරු ව්‍යාවස්ථා නොතිබුණි.	පිළිගන්නා බව.	ප්‍රධාන කරුණු වෙනුවෙන් අතුරු ව්‍යාවස්ථා පනවා ගැනීමට කටයුතු කළ යුතුය.

3.2 හඳුනාගත් පාඩු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ඉකුත් වර්ෂ වලදී බැකෝ ලෝඩරයේ පසුපස දොර වීදුරු දෙක හා වම් පස පැති වීදුරුව බිඳී ගොස් තිබුණද අදාල හානිය සම්බන්ධයෙන් මු.රෙ. 104 ප්‍රකාරව පරීක්ෂණයක් සිදු කර, අලාභය අය කර ගැනීමට හෝ කපා හැරීමට කටයුතු කර නොතිබුණි.	පරීක්ෂණ කටයුතු සිදු කරමින් පවතින බව.	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කළ යුතුය.

3.3 කළමනාකරණ අකාර්යක්ෂමතා

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	මානව සම්පත් සැලැස්මෙහි 2024 වර්ෂය තුලදී ප්‍රමුඛතාව පදනම් කරගෙන විෂයයන් 10 කට අදාලව පුහුණු වැඩමුළු 10 ක් වසර පුරා දින 21 ක් ආවරණය වන පරිදි පැවැත්වීමට සැලසුම් කර තිබුණද, කිසිදු පුහුණු වැඩසටහනක් පවත්වා නොතිබුණු අතර, පුහුණු වැඩසටහන සඳහා නිසි අනුමැතිය ලබා ගෙන නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සැලැස්ම ප්‍රකාරව පුහුණු වැඩමුළු පැවැත්විය යුතුය.
(ආ)	ප්‍රාදේශීය සභාව භුක්ති විදින ඉඩම් 18 ක් සුසාන භූමි 20ක් හා ක්‍රිඩා පිටි 06 ක් ඇතුලුව රු.77,282,000 ක් වටිනා ඉඩම් 44ක් අයිතිය ප්‍රාදේශීය සභාවට පවරාගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම් පවරා ගැනීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතින බව.	අයිතිය පවරාගැනීමට කටයුතු කළ යුතුය.
(ඇ)	පරිසර බලපත්‍ර ලබා ගත යුතු කර්මාන්ත බාණ්ඩ 07 කට අදාළ ආයතන 105 ක් වෙළද බලපත්‍රය ලබාගෙන තිබුණි, ඉන් ආයතන 42 ක් පරිසර බලපත්‍රය ලබානොගෙන ක්‍රියාත්මකව තිබූ අතර, බලපත්‍ර ලබානොදීම මත සභාවට රු.168,000 කට ආසන්න ආදායමක් අහිමිවි තිබුණි.	පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගතයුතු ආයතන වල පමණක් පරිසර බලපත්‍ර නිකුත් කරන බව.	පරිසර ආරක්ෂණ බලපත්‍ර ලබා ගත යුතු ආයතන සමීක්ෂණය කර බලපත්‍ර නිකුත් කළ යුතුය.
(ඈ)	පිබිදෙමු පොළොන්නරුව ව්‍යාපෘතිය මඟින් 2021 දෙසැම්බර් 10 දින ප්‍රාදේශීය සභාවට භාර දී තිබූ භාණ්ඩ අයිතම 11 කට අදාල භාණ්ඩ ඒකක 286 ක් තොග ලේඛණ වලට ඇතුලත් කිරීමකින් තොරව අහල් 3,2,1 GI බට හා 16mm දඟර වානේ විවිධ කටයුතු සඳහා භාවිතා කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට එලෙස නිකුත් නොකල භාණ්ඩ ශේෂයක් ගබඩාවේ පැවතුණි.	තොග ලේඛන වලට ඇතුලත් කරගැනීමට කටයුතු කරන බව.	තොග ලේඛන වලට ඇතුලත් කළ යුතුය.
(ඉ)	ඉදිකිරීම සඳහා සුදුසු ස්ථානයක් හා යෝග්‍ය පරිසර සාධක අධ්‍යනයකින් තොරව රු.3,868,099 ක් වැයකර ඉදිකර තිබූ රිෆායිපුර විද්‍යුත් පුස්තකාල ගොඩනැගිල්ල පොදු සුසාන භූමියට යාබදව ඉදිකර තිබුණි.	දේශපාලන අධිකාරිය මගින් ස්ථාන නම් කිරීම සිදු කර ඇති බව.	සුදුසු ස්ථාන හඳුනාගෙන ගොඩනැගිලි ස්ථාපිත කළ යුතු බව.

3.4 වත්කම් කළමනාකරණය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 දෙසැම්බර් 21 දිනැති භාණ්ඩාගාර නියෝජ්‍ය ලේකම්ගේ අංක 2/2017 දරන වත්කම් කළමණාකරණ චක්‍රලේඛය ප්‍රකාරව වාහන දෙකක අයිතිය පවරා ගැනීමට සමාලෝචිත වර්ෂයේද කටයුතු කර නොතිබුණි.	අයිතිය පවරා ගැනීමට කටයුතු කරන බව.	අයිතිය පවරා ගැනීමට කටයුතු කළ යුතුය.

3.5 නිශ්ක්‍රීය හා ඌණ උපයෝජිත දේපල, පිරියත හා උපකරණ

ප්‍රාදේශීය සභාව සතු රු. 179,863,914 ක වත්කම් අයිතම 08 ක් හා වටිනාකම තක්සේරු නොකල වත්කම් අයිතම 05ක් ඇතුළුව වත්කම් අයිතම 13ක් විවිධ හේතු මත වසර 02 සිට වසර 08 දක්වා කාලයක සිට ප්‍රයෝජනයට ගැනීමකින් තොරව නිෂ්කාර්යව පැවතුණි.	පිළිගන්නා බව.	වත්කම් උපයෝජනය කළ යුතුය.

3.6 මානව සම්පත් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	ප්‍රාදේශීය සභාවේ ලේකම්, ආයුර්වේද වෛද්‍ය නිළධාරී, සංවර්ධන නිළධාරී ඇතුළු විවිධ තනතුරු 11 කට අදාල නිලධාරීන් 17 දෙනෙකුගේ පුරප්පාඩු පැවති අතර සෞඛ්‍ය කම්කරු හා පුස්තකාල සහායක තනතුරු සඳහා නිළධාරීන් 08 ගේ අතිරික්තයක් පැවතුණි.	පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත දැනුම් දී ඇති බව.	පුප්පාඩු සම්පූර්ණ කර ගැනීමට හා අතිරික්ත සේවකයින් වෙනුවෙන් අනුමැතීන් ලබාගත යුතුය.
(ආ)	ප්‍රාදේශීය සභාවේ පුස්තකාල සහායක , මාර්ග කම්කරු, සෞඛ්‍ය හා ජල කම්කරු වැනි තනතුරුවල සේවයකරන නිලධාරීන් 12 දෙනෙකු තම නිත්‍ය තනතුරුවලට අදාල නොවන කළමණාකරන සේවා නිළධාරී, ආදායම් පරීක්ෂක, පුස්තකාලයාධිපති, ඖෂධ සංයෝජක හා කාර්යාල කාර්ය සහායක තනතුරුවලට අදාල රාජකාරී ඉටුකරමින් පැවතුණි.	සභාවේ පවතින සේවයේ අවශ්‍යතාවය මත ඔවුන් යොදවා ඇති බව.	නිත්‍ය තනතුරු වල සේවයේ යෙදවිය යුතුය.

4. ගිණුම්කටයුතුභාවය හා යහ පාලනය

4.1 වාෂර්ික ක්‍රියාකාරී සැලැස්ම

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
ක්‍රියාකාරි සැලැස්මේ නොමැති සංවර්ධන කටයුතු 07ක් සමාලෝචිත වර්ෂයේදී සිදුකර රු.36,467,018 ක වියදමක් දරා තිබූ අතර සැලසුම්කල සංවර්ධන වැඩ 05ක් සමාලෝචිත වර්ෂ වලදී ඉටුකර නොතිබූ අතර ක්‍රියාකාරි සැලැස්ම මනා අවධානයෙන් හා ප්‍රයෝජනවත් ලෙස සකස් කර නොතිබුණි.	ඉදිරියේදී නිවැරදි කිරීමට කටයුතු කරන බව.	සැලැස්මට අනුකූලව කටයුතු ඉටු කළ යුතුය.

4.2 අභ්‍යන්තර විගණනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2015 මාර්තු 18 දිනැති උතුරුමැද පළාත් පාලන කොමසාරිස්ගේ චක්‍රලේක අංක 4/2015 හි 1.3 ප්‍රකාරව අභ්‍යන්තර විගණන නිළධාරියෙකු පත් කර සෑම මසකම අවසානයේදීම මහා සභාවට වාර්තාවක් ඉදිරිපත් කළ යුතු වුවද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදු කර ආයතනයේ කාර්යය හා කර්තව්‍ය ඉටු කිරිමට සහයක් ලබා දී නොතිබුණි.	නිවැරදි කර ගන්නා බව.	චක්‍රලේඛ උපදෙස් අනුව කටයුතු කළ යුතුය.

4.3 අයවැය පාලනය

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
සමාලෝචිත වර්ෂයේ සභාවේ අයවැයගත වියදම් හා සත්‍ය වියදම් සමහ පරික්ෂාවේදී වියදම් විෂයන් 13 ක් සඳහා සලසා තිබුණු රු.2,112,750 ක සම්පූර්ණ ප්‍රතිපාදන මුදලම ඉතිරි කර තිබූ අතර තවත් වැය විෂයයන් 84 ක සලසා දී තිබූ ප්‍රතිපාදන මුදල සියයට 10 සිට සියයට 99 දක්වා එනම් රු. 3,800 සිට 5,608,530 දක්වා පරාසයක ඉතිරි කර තිබීම හේතුවෙන්,අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය මහපෙන්වීමක් ලෙස භාවිතා කර නොතිබුණි.	විවිධ හේතු මත වෙනස හට ගෙන ඇති බව.	අයවැය ලේඛනය ඵලදායි මූල්‍ය මහපෙන්වීමක් ලෙස භාවිතා කළ යුතුය.

4.4 පාරිසරික ගැටළු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශයේ රු.167,493,875 ක ප්‍රතිපාදන මත ඉදිකල සුංගාවිල කසල කළමණාකරන මධ්‍යස්ථානයේ කච්ෂිමා යන්ත්‍රය සඳහා ප්‍රමාණවත් කසල නොලැබීම මත ක්‍රියාත්මක නොකර මිනිස් ශ්‍රමය යොදාගෙන කොම්පෝස්ට් නිෂ්පාදනය සිදු කරමින් පැවතුණි.	පිලිගන්නා බව.	යන්ත්‍රය උපයෝගි කර ගත යුතුය.

4.5 තිරසාර සංවධර්න අරමුණු

විගණන නිරීක්ෂණය	සභාවේ අදහස් දැක්වීම	නිර්දේශය
2017 අංක 19 දරන තිරසාර සංවර්ධන පනත ප්‍රකාරව ප්‍රාදේශීය සභාව විසින් තිරසර සංවර්ධන අරමුණු, වැඩසටහන් හා නිර්ණායක හදුනාගෙන ක්‍රියාත්මක කිරීමක් සිදු කර නොතිබුණි.	ඉදිරි වර්ෂයේදි වැඩසටහන් වෙන් කර හදුනා ගන්නා බව.	පනතේ දක්වා ඇති අරමුණු හා වැඩසටහන් වලට අනුකූලව කටයුතු කළ යුතුය.